# 22 තුසිතට ලිපියක්

තුසිත සඳරුවන්ගේ පැනේ මිතුරෙකි. තුසිත කුඩා කල සිට ම දෙමව්පියන් සමග කැනඩාවේ පදිංචි වී සිටියි. ඔහු ලංකාවේ සුන්දරත්වය ගැන දැන ගැනීමට හරි ම කැමතියි. ලංකාවේ දියඇලි පිළිබඳ විස්තර සඳහන් කළ ලිපියක් සඳරුවන් තුසිතට යැව්වා. පහත දැක්වෙන්නේ එම ලිපියයි.

සඳරුවන් බණ්ඩාර,
"සඳ කැළුම්",
නුවරපාර,
ඇතුගල්පුර,
ශ්‍රී ලංකාව.
2008-03-21

**සැපවේවා!**

හිතවත් තුසිතට,

ඔයා එවූ ලිපිය ලැබුණා. පිළිතුරු පමා වීම ගැන කනගාටුයි. පසුගිය දිනවල පළමු වාර පරීක්ෂණයට සූදානම් වීමට සිදුවුණා. අපි හැමදෙනා ම සුවෙන් සිටිනවා. ඔයාත් පවුලේ සැමත් සුවෙන් ඇතැයි සිතනවා.

ඔන්න අද මම ඔයා ගොඩක් ආසාවෙන් බලා සිටි දෙයක් ගැන ලියා එවනවා.

කැනඩාව වගේ ම අපේ රටත් හරි ම ලස්සනයි. ස්වාභාවික සුන්දරත්වය අපට ලැබුණු දායාදයක්. මිහිදුම් සේලයෙන් වැසුණු ලස්සන කඳුවැටි, මුහුදට ගලා බසින ගංගා, කඳුවැටි අතරින් ඇද හැලෙන අලංකාර දිය ඇලි දැක්කොත් ඔයා මෙහේ නවතීවි.

අපේ රට මැද තියෙන කඳුකරයෙන් ඇද හැලෙන දිය ඇලි ගණන 150ක් විතර වෙනවා. ඒවාට කියන නම් ඇසුවොත් ඔයා පුදුම වෙයි.

කොළඹට කිට්ටුවෙන් ම තිබෙන්නේ බෝපත් ඇල්ල. ඒකට ඒ නම කියන්නේ බෝ කොළයක හැඩේට වතුර ගලා හැලෙන නිසා.

ලක්ෂපාන දිය ඇල්ලට ඒ නම වැටුණේ ගල්කුළු ලක්ෂයක් මැදින් ගලා හැලෙන නිසා ලු. ලක්ෂය හා පහණ (ගල) යන වචන එකතු වී ලක්ෂපාන වූ බව අපේ ගුරුතුමිය පැවසුවා. ජලවිදුලි බලය නිපදවන්න මේ දිය ඇල්ල උදව් කරගෙන තිබෙනවා. එයින් විදුලි පහන් ලක්ෂයක් විතර දල්වන්නට පුළුවන්.

ඔයා දන්නව ද? තුසිත, අපේ රටේ උස ම ඇල්ල බඹරකන්ද දිය ඇල්ල. දිය ඇල්ලට ඒ නම ලැබුණ හැටි ගැන කියවෙන කතාව හරි ම අපූරුයි. වනමල්වල සුවඳට ආපු වන බඹරු කන්දේ බඹර බැඳලා. ඒ නිසා ඒ කන්ද බඹර කන්ද ලෙස හඳුන්වලා තියෙනවා. බඹර කන්ද කඳුවැටිය අතරින් ඇද හැලෙන නිසා දියඇල්ලටත් ඒ නම වැටිලා.

දුන්හිඳ දියඇල්ලෙන් කඩා හැලෙන රිදී පාට දිය කඳේ පෙණපිඩු ඈතට පුළුන් ගොඩක් වගේ පෙනෙනවා. හරියට නිල් අහසේ වලාකුළු කැටි බිමට



වැටිලා වගේ. ගලා හැලෙන දිය ඇල්ල දෙව්ලොව සිට මහ පොළොවට දැමූ සේද සළුවක් වගේ ඈතට පෙනෙනවා. ඒ දර්ශනය දැක්කොත් නම් ඔයා එතනින් ආපසු එන්නේ නැතිවෙයි. අපි පසුගිය දවසක දුන්හිඳ බලන්න ගියා. ඇල්ලට යන අඩි පාරේ තියෙන කඩේකින් තැම්බු බෙලිමල් වතුර බිව්වා. කිතුල් හකුරුත් එක්ක බෙලිමල් වතුර හරි ම රසයි. ඔයා මෙහෙ ආව දවසක බෙලිමල් රස බලන්න එක්කගෙන යන්නම්.

දියඇලි කිහිපයකට උපත දෙන ඇල්ල ඇලිදෝනා ඇල්ල ලෙස හඳුන්වනවා. දැන් ඒකට කියන්නේ ඇබර්ඩීන් ඇල්ල කියලා.

වෙහෙර ඇල්ලත් බලන්න ලස්සනයි. ඒක පටන් ගන්නේ බුළුතොට ගඟෙන්. මේ ඇල්ල දෙස බලා සිටින විට දවස ගතවෙනවා දැනෙන්නේ නැහැ. ඒක ඈතට පෙනෙන්නේ හරියට මනාලියක් හිස පැළඳි සුදෝ සුදු වේලය වගෙයි.

ඔයා ලංකාවට ඇවිත් මේ ලස්සන බැලුවොත් ආපසු මේ රට දාලා යන්නෙත් නැතිවෙයි. මේ සමග ඔයාට දියඇලිවල පින්තූර ටිකකුත් එවනවා.

ඔයාටත් පවුලේ සැමටත් තෙරුවන් සරණයි.

මීට,<br>
හිතවත් මිතුරා,<br>
සඳරුවන්

මෙවැනි ලිපියක සම්මත ආකෘතිය හඳුනා ගන්න.




## ක්‍රියාකාරකම : 1

1. ඔබගේ උපන්දින උත්සවයට පැමිණෙන ලෙස දන්වමින් මිතුරෙකුට/ මිතුරියකට

   හෝ

2. තම පවුලේ තොරතුරු දන්වමින් ඈත පළාතක සිටින ඔබගේ ඥාතියකුට හෝ ලිපියක් ලියන්න.

## ක්‍රියාකාරකම : 2

විවිධ කරුණු ඔස්සේ ලියවුණ පෞද්ගලික ලිපි සොයාගෙන පෞද්ගලික ලිපි එකතුවක් සකස් කරන්න.